# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2048/15 – 2017 දෙසැම්බර් මස 04 වැනි සඳුදා – 2017.12.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 01 රීතිය – බලපත්‍රය සඳහා වන නිර්ණායක**

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ 23 වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

| | | |
|---|---|---|
| 1. යෝග්‍යතාවය | 1.1 | පනත යටතේ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලැබීමට නම්, අයදුම්කරු 1980 අංක 31 දරන ස්වෙච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචිය හා අධීක්ෂණය) පනත යටතේ ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධානයක් විය යුතුය. |
| | 1.2 | පසුගිය අවුරුදු තුනට අදාළව විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ක්ෂුද්‍රමූල්‍ය කටයුතු හා සම්බන්ධ ක්‍රියාකාරකම් ඇතුළත් වාර්තාවක් සෑම අයදුම්කරන රාජ්‍ය නොවන සංවිධානය විසින්ම ඉදිරිපත් කළ යුතුය. |
| 2. අවම මූලික ප්‍රාග්ධනය | 2.1 | සෑම අයදුම්කරන රාජ්‍ය නොවන සංවිධානයක්ම 2017 අංක 03 දරන අවම මූලික ප්‍රාග්ධන රීතියෙහි දක්වා ඇති පරිදි, ජාතික මට්ටමේ සෑම ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් විසින්ම රුපියල් මිලියන පහකට (රු. 5,000,000/-) නොඅඩු ප්‍රාරම්භක මූලික ප්‍රාග්ධනයක් ද, දිස්ත්‍රික් මට්ටමේ සෑම ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් විසින්ම රුපියල් මිලියන දෙකකට (රු. 2,000,000/-) නොඅඩු ප්‍රාරම්භක මූලික ප්‍රාග්ධනයක් ද පවත්වා ගත යුතුය. |
| 3. මණ්ඩලයේ සංයුතිය | 3.1 | කළමනාකරණ මණ්ඩලයේ අධ්‍යක්ෂවරු සංඛ්‍යාව පහකට (05) වඩා නොඅඩු විය යුතු අතර පහළොවකට (15) වඩා වැඩි නොවිය යුතුය. |
| | 3.2 | කාන්තා අධ්‍යක්ෂවරියන් සංඛ්‍යාව අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයෙන් හතරෙන් එකකට වඩා වැඩි විය යුතුය. |


1A – PG 3799 – 307 (2017/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3.3 අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් ලෙස එකම පවුලේ සාමාජිකයින් දෙදෙනෙකුට වඩා සිටිය නොහැක. (මේ සඳහා එකම පවුලේ සාමාජිකයින් ලෙස කලත්‍රයා, දරුවන්, දෙමව්පියන් හා සහෝදර සහෝදරියන් අයත් වේ.)

4. අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීම

4.1 ඇමුණුම 1 හි දැක්වෙන "NSNGO/MFNGO/A" පෝරමයේ ආකාරයට බලපත්‍රය සඳහා වන සියළුම අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

5. ඇගයීම් ගාස්තුව

5.1 සෑම අයදුම්කරන ජාතික මට්ටමේ රාජ්‍ය නොවන සංවිධානයක් ම රුපියල් විසි දහසක් (රු. 20,000.00) ද, සෑම දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය නොවන සංවිධානයක් ම රුපියල් දස දහසක් (රු. 10,000.00) ද නැවත නොගෙවන ඇගයීම් ගාස්තුවක් ලෙස අයදුම් පත්‍රය යොමු කරන අවස්ථාවේ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය වෙත ගෙවිය යුතුය.

**ශාක්‍ය නානායක්කාර**
අධ්‍යක්ෂ ජනරාල් / රෙජිස්ට්‍රාර්
රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය.

**පෝරමය NSNGO/ MFNGO/A**

**<u>රහසිගතයි</u>**

## 2016 අංක 6 දරන ක්ෂුද්‍ර මූල්‍ය පනත යටතේ ලියාපදිංචිය සඳහා අයදුම්පත්‍රය

**උපදෙස්**

(1) සියලුම අයදුම්පත් පරිඝනක ආධාරයෙන් යතුරුලියනය කර තිබිය යුතුය.

(2) අයදුම්පත්‍රයේ අදාළ තොරතුරු පිළිබඳ සම්පූර්ණ විස්තර සැපයීමට ලබා දී ඇති ඉඩ ප්‍රමාණවත් නොවන්නේ නම්, කරුණාකර අවශ්‍ය අවස්ථාවලදී අමතර කඩදාසි පාවිච්චි කරන්න. එවැනි සෑම අමතර කඩදාසියකම අදාළ අයදුම්පතේ හරස් යොමුව දැක්විය යුතුය. යම් තොරතුරක් අදාළ නොවන්නේ නම් ඒ බව පැහැදිළිව සඳහන් කළ යුතුය.

(3) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඇමුණුම් ද ඇතුළත්ව සෑම පිටුවක් ම අඩුම වශයෙන් අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකු විසින් කෙටිසන් තැබිය යුතුය.

(4) 01 වන උපලේඛනයේ සඳහන් කර ඇති සියලුම ලේඛන අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

(5) අයදුම් කරන රාජ්‍ය නොවන සංවිධානයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු සාමාජිකයින්ගේ අත්සන් සහිත සම්පූර්ණ කරන ලද අයදුම්පත, අනිකුත් ලේඛන ද සමඟ පහත සඳහන් ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල් / ලේඛකාධිකාරී
රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය
3 වන මහළ, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

අධ්‍යක්ෂ ජනරාල් / ලේඛකාධිකාරි
රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය
3 වන මහළ, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

...................................................................................................................................... පිහිටි
(ලිපිනය)

......................................................................................................................................
(නම)

2016 අංක 6 දරන ක්ෂුද්‍ර මූල්‍ය පනතේ විධිවිධානයන්ට අනුකූලව ලියාපදිංචිය ලබාගැනීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්/ ලේඛකාධිකාරී වෙත මෙයින් අයදුම් කරනු ලැබේ. අයදුම්පත සනාථ කිරීම සඳහා පහත තොරතුරු හා ලේඛන ඉදිරිපත් කරනු ලැබේ.

(1) රාජ්‍ය නොවන සංවිධානයේ සාමාන්‍ය තොරතුරු

1.1. රාජ්‍ය නොවන සංවිධානයක් වශයෙන් සංස්ථාපිත කළ දිනය:

1.2. මෙහෙයුම් කටයුතු ආරම්භ කළ දිනය:

1.3. පහත සඳහන් ස්ථානයන්හි ලිපිනයන්:

1.3.1. ලියාපදිංචි කළ කාර්යාලය:

1.3.2. ප්‍රධාන /පරිපාලන කාර්යාලය (න්):

1.3.3. ශාඛා කාර්යාලය(න්):

| පිහිටීම | දිස්ත්‍රික්කය | පළාත | දුරකථන අංකය/ විද්‍යුත් තැපැල |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

1.4. රාජ්‍ය නොවන සංවිධානයේ මූල්‍ය වර්ෂය: .......................... සිට .........................දක්වා

1.5. සංවිධානය මඟින් ක්‍රියාත්මක කරන ප්‍රධාන ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු කවරේද?

1. ......................................................................................................................................
......................................................................................................................................
2. ......................................................................................................................................
......................................................................................................................................
3. ......................................................................................................................................
......................................................................................................................................
4. ......................................................................................................................................
......................................................................................................................................

**1.6. (අ) අධ්‍යක්ෂ මණ්ඩලය**

| අධ්‍යක්ෂවරයාගේ සම්පූර්ණ නම (කරුණාකර පළමුව සභාපතිගේ නම සඳහන් කරන්න) | පදිංචි ලිපිනය | උපන් දිනය දිනය/මාසය/අවු: | ජා.හැ. අංකය | විදේශ ගමන් බලපත්‍රය | අධ්‍යක්ෂ-වරයෙකු ලෙස පත්කළ දිනය දින/මාස/අවු | ඉහළම අධ්‍යාපන සුදුසුකම්/ ක්ෂේත්‍රයේ පළපුරුද්ද | ස්ථිර රැකියාව | දුරකථන අංකය/ විද්‍යුත් ලිපිනය |
|---|---|---|---|---|---|---|---|---|
| 1. | | | | | | | | |
| 2. | | | | | | | | |
| 3. | | | | | | | | |
| 4. | | | | | | | | |
| 5. | | | | | | | | |
| 6. | | | | | | | | |
| 7. | | | | | | | | |
| 8. | | | | | | | | |
| 9. | | | | | | | | |
| 10. | | | | | | | | |
| 11. | | | | | | | | |
| 12. | | | | | | | | |
| 13. | | | | | | | | |
| 14. | | | | | | | | |
| 15. | | | | | | | | |

අ/ අනෙකුත් ආයතනයන්හි දරන තනතුරු

**1.6. (ආ) ප්‍රධාන විධායක නිලධාරි/ සාමාන්‍යාධිකාරි**

| ප්‍රධාන විධායක නිලධාරියාගේ/ සාමාන්‍යාධිකාරිගේ සම්පූර්ණ නම | පදිංචි ලිපිනය | උපන් දිනය දිනය/මාසය/අවු: | ජා.හැ. අංකය | ප්‍රධාන විධායක නිලධාරි ලෙස පත්කල දිනය දින/මාස/අවු | සුදුසුකම් | රැකියාව අ/ | සම්බන්ධ කරගත හැකි තොරතුරු |
|---|---|---|---|---|---|---|---|
| 1. | | | | | | | |
| 2. | | | | | | | |

අ/ අනෙකුත් ආයතනයන්හි දරන තනතුරු

1.7 රාජ්‍ය නොවන සංවිධානයේ බැංකුකරුවන්ගේ නම් සහ ලිපිනයන් :

| බැංකුවේ නම | ගිණුම් අංකය | ශාඛාව | ලිපිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

1.8 **විගණකවරු (බාහිර)**

1.8.1. බාහිර විගණකගේ සම්බන්ධ කරගත හැකි තොරතුරු:

| බාහිර විගණකගේ නම | ලිපිනය | දුරකථන අංකය/විද්‍යුත් තැපැල |
|---|---|---|
| | | |

1.8.2. කුමන මූල්‍ය වර්ෂයේ සිට රාජ්‍ය නොවන සංවිධානයේ විගණන කටයුතු ඉහත විගණක විසින් සිදු කරනු ලබන්නේද?

1.8.3. විගණන ආයතනයේ හවුල් කරුවන්/අධ්‍යක්ෂවරුන් රාජ්‍ය නොවන සංවිධානයේ අධ්‍යක්ෂවරුන්ගේ පවුලේ සාමාජිකයින් වේද?
(ඔව් නම් කරුණාකර විස්තර සපයන්න.)

1.8.4. පසුගිය මූල්‍ය වර්ෂ තුන සඳහා ගෙවන ලද විගණන ගාස්තු (එක් එක් වසර සඳහා වෙන් වෙන්ව දක්වන්න):

1.8.5. විගණන ආයතනයේ හෝ විගණන ආයතනයේ හවුල්කරුවෙකුට/අධ්‍යක්ෂවරයෙකුට කුමන හෝ ආකාරයේ මූල්‍ය පහසුකමක් ලබාදී ඇත්ද? (ඔව් නම් කරුණාකර විස්තර සපයන්න.)

(අ) නම:
(ආ) මූල්‍ය පහසුකම් ප්‍රමාණය:

1.9 **විගණකවරු (අභ්‍යන්තර)**

1.9.1. රාජ්‍ය නොවන සංවිධානය සතුව අභ්‍යන්තර විගණන අංශයක් පවතී ද යන්න සඳහන් කරන්න. එසේ පවතී නම්, පහත විස්තර සපයන්න.

(අ) අභ්‍යන්තර විගණකගේ නම:
(ආ) ඉහළම අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද:
(ඇ) අභ්‍යන්තර විගණන කටයුතු කරන සම්පූර්ණ කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ සුදුසුකම්:

| නම | ඉහළම අධ්‍යාපන සුදුසුකම් | සේවයේ යෙදී සිටින වර්ෂ ගණන |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

2. **රාජ්‍ය නොවන සංවිධානයේ මූලික ප්‍රාග්ධනය**

පසුගිය මූල්‍ය වර්ෂ තුනට (3) අදාළව සහ අයදුම්පත්‍රය සකස් කරන මාසයට පෙර මාසයේ අවසාන දිනට අදාළව:

| අයිතමය | 20…… | 20…… | 20…… | 20…… දිනට |
|---|---|---|---|---|
| (අ) නිකුතු සහ සම්පූර්ණයෙන් ගෙවා නිමි කොටස් (මුදලට) | | | | |
| (ආ) ආධාර | | | | |
| (ඇ) පොදු සංචිත | | | | |
| (ඈ) අනිවාර්ය සංචිත | | | | |
| (ඉ) පසුගිය විගණන වාර්තාවලට අනුව රඳවාගත් ලාභය හෝ (අලාභය) | | | | |
| (ඊ) මූලික ප්‍රාග්ධනය (අ) සිට (ඊ) දක්වා | | | | |

3. **නිශ්චල දේපළවල විස්තර (ඉඩම් හා ගොඩනැගිලි)**

| නිශ්චල දේපළ වර්ගය | පිහිටීම (ලිපිනය) | පිරිවැය | ප්‍රත්‍යාගණනය (ඇත්නම්) | |
|---|---|---|---|---|
| | | | දිනය | වටිනාකම (රු.) |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

1 වන උපලේඛනයේ අයිතම අංක 5 උපයෝගී කරගන්න.

4. **විශාල නිරාවරණ**

(ඉල්ලුම් කරන රාජ්‍ය නොවන සංවිධානයේ මූලික ප්‍රාග්ධනයෙන් සියයට පහක් (5%) ඉක්මවන හෝ විශාලතම නිරාවරණ දහය)

| රාජ්‍ය නොවන සංවිධානයේ/සමාගමේ/ තනි පුද්ගලයන්ගේ නම | සම්බන්ධතාවයේ ස්වභාවය[1] | ණය වර්ගය | වර්ගීකරණය[8] | ණය සහ අත්තිකාරම් | | සුරැකුම් | |
|---|---|---|---|---|---|---|---|
| | | | | ප්‍රදානය කළ වටිනාකම (රු. 000) | පිටහිටි ශේෂය (රු. 000) | වටිනාකම (රු. 000) | වර්ගය |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

HL - නිවාස ණය L - ජීවනෝපාය ණය C - පරිභෝජන ණය O - වෙනත්

C - හිඟ නොමැත O - දින 30 - 60 S - දින 61 - 90 දක්වා හිඟ D - දින 91 - 180 දක්වා හිඟ L - දින 180ට වඩා හිඟ

5. වත්කම්වල ගුණාත්මකභාවය

| ණය වර්ගය | ක්‍රමික ණය | | අක්‍රමික ණය | | | | | | | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | හිඟ නොමැත | | දින 31 - 60 | | දින 61 - 90 දක්වා හිඟ | | දින 91 - 180 දක්වා හිඟ | | දින 180ට වඩා හිඟ | | | |
| | ගිණුම් සංඛ්‍යාව | පිටහිටි ශේෂය (රු. '000) | ගිණුම් සංඛ්‍යාව | පිටහිටි ශේෂය (රු. '000) | ගිණුම් සංඛ්‍යාව | පිටහිටි ශේෂය (රු. '000) | ගිණුම් සංඛ්‍යාව | පිටහිටි ශේෂය (රු. '000) | ගිණුම් සංඛ්‍යාව | පිටහිටි ශේෂය (රු. '000) | ගිණුම් සංඛ්‍යාව | පිටහිටි ශේෂය (රු. '000) |
| නිවාස ණය | | | | | | | | | | | | |
| ජීවනෝපාය ණය | | | | | | | | | | | | |
| පරිභෝජන. ණය | | | | | | | | | | | | |
| වෙනත් | | | | | | | | | | | | |
| එකතුව | | | | | | | | | | | | |

6. අයදුම්පත්‍රය ඉදිරිපත් කරන මාසයට පෙර මාසයේ අවසානයට අදාළව රාජ්‍ය නොවන සංවිධානය විසින් ලබාගත් ණය පිළිබඳ විස්තර

| මූලාශ්‍ර | ලබාගත් ණය මුදල (රු. '000) | වාර්ෂික පොළී අනුපාතිකය | ණය ලබාගත් දිනය | සුරැකුමේ ස්වභාවය | පිටහිටි ශේෂය (රු. '000) |
|---|---|---|---|---|---|
| (i) | | | | | |
| (ii) | | | | | |
| (iii) | | | | | |
| එකතුව | | | | | |

7. අයදුම්පත්‍රයේ සඳහන් දිනට පැවතුණු පොළී අනුපාතිකය/අයකිරීම්

| වර්ගය | ණය පොළී අනුපාතික (පරාසය/වාර්ෂික) | | | | පැහැර හැරීමේ ගාස්තු | |
|---|---|---|---|---|---|---|
| | මාස 12ට අඩු | මාස 12 | මාස 24 | මාස 24ට වැඩි | % | මුදල (රු. '000) |
| නිවාස ණය | | | | | | |
| ජීවනෝපාය ණය | | | | | | |
| පරිභෝජන ණය | | | | | | |
| වෙනත් | | | | | | |
| | | | | | | |

මෙම අයදුම්පතේ සඳහන් තොරතුරු පරීක්ෂා කළ බවත්, ඒවා සෑම අතින්ම සම්පූර්ණ බවත් සහ අපගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට එම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, අපි ප්‍රකාශ කර සිටිමු.

.................................................................................................................................................... වෙනුවෙන්
(අයදුම්කරන රාජ්‍ය නොවන සංවිධානයේ නම)

| අධ්‍යක්ෂවරුන්ගේ නම් | අත්සන |
|---|---|
| 1 ................................................................... | .......................... |
| 2 ................................................................... | .......................... |
| 3 ................................................................... | .......................... |
| 4 ................................................................... | .......................... |
| 5 ................................................................... | .......................... |
| 6 ................................................................... | .......................... |
| 7 ................................................................... | .......................... |
| 8 ................................................................... | .......................... |
| 9 ................................................................... | .......................... |
| 10 ................................................................... | .......................... |
| 11 ................................................................... | .......................... |

12 ………………………………………………………… ……………………
13 ………………………………………………………… ……………………
14 ………………………………………………………… ……………………
15 ………………………………………………………… ……………………

දිනය :- ……………………… (රාජ්‍ය නොවන සංවිධානයේ මුද්‍රාව)

අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ලේඛන

1. ලියාපදිංචි සංස්ථාපිත සහතිකයේ සහතික කරන ලද පිටපතක්.
2. රාජ්‍ය නොවන සංවිධානයේ සාංගමික ව්‍යවස්ථාවලිය සහ / හෝ සාංගමික සංස්ථා පත්‍රයෙහි සහතික කරන ලද පිටපතක්.
3. අධ්‍යක්ෂක මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රධාන විධායක නිලධාරී, සාමාන්‍යාධිකාරී හා එවැනි පත්වීමක් සඳහා තෝරා ගන්නා ලද පුද්ගලයෙකුගේ දිවුරුම් ප්‍රකාශ හා ප්‍රකාශයන් ආකෘති පත්‍ර 1 (ඒ) හා ආකෘති පත්‍ර 1 (බී) අනුව.
4. එක් එක් නිශ්චල දේපළ ප්‍රතිගණනය කළ තක්සේරු වාර්තාවල සහතික කරන ලද පිටපත්.
5. අයදුම්කරන රාජ්‍ය නොවන සංවිධානයේ සහ එහි පාලක රාජ්‍ය නොවන සංවිධානයේ පසුගිය වර්ෂ 03 සඳහා විගණන ගිණුම් වාර්තා.
6. අයදුම් පත්‍රයේ සඳහන් දිනට පෙර මාසය අවසානට අයදුම්කරන රාජ්‍ය නොවන සංවිධානයේ මූල්‍ය ප්‍රකාශන.
7. අයදුම්කරන රාජ්‍ය නොවන සංවිධානයේ සංවිධාන ව්‍යූහය.
8. අයදුම්කරන රාජ්‍ය නොවන සංවිධානයේ මෙහෙයුම් අත් පොතෙහි පිටපතක්.
9. බලපත්‍රය ලබා ගැනීමෙන් පසු එළඹෙන ඉදිරි වර්ෂ දෙක තුළ තැන්පතු, ණය දීම් සහ අනෙකුත් මෙහෙයුම් කටයුතුවල සහ ලාභ අලාභ පිළිබඳ පුරෝකථනයන් ඇතුළත් ශක්‍යතා වාර්තාවක්.
10. 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ විධිවිධානයන්ට අනුකූලව නිකුත් කර ඇති නියමයන් හා විධානයන්ට අනුකූල වීම සඳහා රාජ්‍ය නොවන සංවිධානයට ඇති හැකියාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශනයක්.

**සටහන :- රෙජිස්ට්‍රාර් විසින් කැඳවනු ලබන වෙනත් විස්තර/වාර්තා**

1 (ඒ) උපලේඛනය

අධ්‍යක්ෂවරයකු/ ප්‍රධාන විධායක නිලධාරිවරයකු/ ප්‍රධාන කළමනාකරුවකු/ එවැනි පත්වීමක් සඳහා තෝරාගන්නා ලද පුද්ගලයකු විසින් ඉදිරිපත් කල යුතු දිවුරුම් ප්‍රකාශයේ ආකෘතිය

## දිවුරුම් ප්‍රකාශය

……………………………………………………………………………………………………………………… (ලිපිනය) හි පදිංචි …………………………………………………………………………………… හැඳුනුම්පත් අංක/ගමන් බලපත්‍ර අංක දරන ………………………………………………………………………………………………… (සම්පූර්ණ නම) වන මම බෞද්ධ/හින්දු/ක්‍රිස්තියානි/කතෝලික/මුස්ලිම් ආගමිකයකු වශයෙන් ගාම්භීර පූර්වක වද, අවංකව ද, සත්‍යවාදීව ද මෙසේ සහතික කරමින් ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.

1. ඉහත නම සඳහන් ප්‍රතිඥාකරු/දිවුරුම්කරු මම වෙමි.

2. ……………………………………………… (තනතුර) වන මම ……………………………………………………(රාජ්‍ය නොවන සංවිධානයේ නම) ආයතනයේ ……………………………………… (තනතුර) ලෙස පත්කිරීමට තේරී පත් වී ඇත.

3. මා හට අදාල ක්ෂේත්‍රයන් හි පහත සඳහන් අධ්‍යාපනික සහ/හෝ වෘත්තීමය සුදුසුකම් ඇති බව ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.
………………………………………………………………………………………………………………………
………………………………………………………………………………………………………………………

4. මාහට පහත සඳහන් පරිදි ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර බැංකු කටයුතු මූල්‍යමය කටයුතු නීතීමය හෝ පරිපාලනමය හෝ වෙනත් අදාල විෂයන් පිළිබඳව මනා පලපුරුද්දක් ඇති බවට ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.
………………………………………………………………………………………………………………………
………………………………………………………………………………………………………………………

5. මම ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පොලිසියක්, යම් නියාමන හෝ අධීක්ෂණ අධිකාරයක්, වෘත්තීයවේදීන්ගේ සංගමයක්, විමර්ෂණ කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක්, වෙනත් නීතිමය ආයතනයක් මගින් යම් වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් පිළිබඳව සිදු කරනු ලබන විමර්ෂණයකට හෝ විභාග කිරීමකට භාජනය වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.

6. මම වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් හෝ ඕනෑම නීතියක් හෝ ඒ යටතේ නිකුත් කරන ලද්දා වූ, රීති, රෙගුලාසි විධාන හෝ නිර්ණයන්ට අනුකූල නොවීම වැනි ක්‍රියාවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ හෝ විදේශයක නීති මඟින් පිහිටුවන ලද අධිකරණයකින්, නියාමන හෝ අධීක්ෂණ අධිකාරයකින්, වෘත්තීයවේදීන්ගේ සංගමයකින්, විමර්ෂණ කොමිෂන් සභාවකින් හෝ වෙනත් මණ්ඩලයකින් වැරදිකරුවෙකු හෝ එකී ක්‍රියාවට සම්බන්ධ පාර්ශවයක් ලෙස හඳුනාගෙන වැරදිකරුවෙකු වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.

7. මම වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් සම්බන්ධයෙන් වන චෝදනා වරදකට අධිකරණයකින් ලබා නොමැති බවට ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.

8. මම කිසියම් අධිකරණයකින් සදාචාර විරෝධී ක්‍රියාවකට සම්බන්ධ වරදකට වැරදිකරු වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.

9. මම ශ්‍රී ලංකාවේ හෝ විදේශයක කිසියම් අධිකරණයකින් වස්තු භංගත්වයට හෝ බංකොලොත් භාවයට පත් බවට ප්‍රකාශ කර නොමැති බවට ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.

10. මම ණය ආපසු ගෙවීමට කිසියම් අධිකරණයකින් දෙන ලද නියෝගයක් හෝ ආඥාවක් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.

11. මම නියාමන හෝ අධීක්ෂණ අධිකාරයක් විසින්, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක කිසියම් ආයතනයක අධ්‍යක්ෂ, ප්‍රධාන විධායක නිලධාරීන් හෝ වෙනත් නිලධාරියෙකු ලෙස සේවයෙන් ඉවත් කර හෝ සේවය අත්හිටුවා නොමැති බවට ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.

12. මම අධිකරණයක් මඟින් සිහි විකල් වූ පුද්ගලයෙකු ලෙස ප්‍රකාශයට පත් වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.

13. මම

(අ) නියාමන හේතූන් මත බලපත්‍රය හෝ ව්‍යාපාරය අවලංගු කරනු ලැබූ හෝ අත්හිටුවනු ලැබූ හෝ

(ආ) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක ඇවර වූ හෝ ඇවර වෙමින් පවතින් හෝ අනිවාර්ය ඇවර කිරීමකට යටත්ව සිටින්නා වූ ඕනෑම බලපත්‍රලාභී බැංකුවක, බැංකු නොවන මූල්‍ය ආයතනයක, අධ්‍යක්ෂවරයෙකු, ප්‍රධාන විධායක නිලධාරියෙකු හෝ වෙනත් බලතල සහිත තනතුරක් දරා නොමැති බවට ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.

14. මම වෙනත් බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක/සමාගමක අධ්‍යක්ෂවරයෙක් හෝ සේවා නියුක්තියකු නොවන බවට ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.

මෙම දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කරුණු ප්‍රතිඥාකරුට/ දිවුරුම්කරුට කියවා තේරුම්කර දුන් අතර ඔහු/ ඇය එම කරුණු සත්‍ය බවට පිළිගෙන ප්‍රතිඥා දී/දිවුරුම් දී ............ දින ............ දී මා ඉදිරිපිටදී අත්සන් තබන ලදී.

අදාළ පරිදි මුද්දර අලවන්න.

මා ඉදිරිපිටදී

සාමාදාන විනිශ්චයකාර/
දිවුරුම් කොමසාරිස්

**සටහන : 1 - අදාළ නොවන වචන කපා හරින්න.**

ක්‍රිස්තියානි හෝ කතෝලික පුද්ගලයන් දිවුරා ප්‍රකාශ කර සිටිය යුතු අතර බෞද්ධ, හින්දු, මුස්ලිම් සහ වෙනත් ආගම් අදහන පුද්ගලයන් සහතික කරමින් ප්‍රතිඥා දිය යුතුය.

1(බී) උපලේඛනය

රාජ්‍ය නොවන සංවිධානයේ නම: ..........................................................................................................................

අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී එවැනි පත්වීමක් සඳහා
තෝරා ගන්නා ලද පුද්ගලයෙක් විසින් ඉදිරිපත් කල යුතු ප්‍රකාශය
(..................... දිනට අදාළ ඇමුණුම් සහිතව)

1. පුද්ගලික තොරතුරු

 1.1 සම්පූර්ණ නම: ..........................................................................................................................
 1.2 ජාතික හැඳුනුම්පත් අංකය: ..........................................................................................................
 1.3 විදේශ ගමන් බලපත්‍ර අංකය: .........................................................................................................
 1.4 උපන් දිනය: ...............................................................................................................................
 1.5 ස්ථිර ලිපිනය: ............................................................................................................................
 1.6 වර්තමාන ලිපිනය: .......................................................................................................................

2. අයදුම්කරන රාජ්‍ය නොවන සංවිධානයේ පත්වීම

 2.1 මණ්ඩලයට/වර්තමාන තනතුරට පත් වූ දිනය:.......................................................................................
 2.2 තනතුර: ......................................................................................................................................
 2.3 දේශීය හෝ විදේශික බව: ..............................................................................................................
 2.4 වාර්ෂික වේතනය (විස්තර සහිතව): ..................................................................................................
 2.5 රා. නො. සංවිධානයෙන් ලැබෙන වෙනත් ප්‍රතිලාභ: ..........................................................................

3. පසුබිම සහ අත්දැකීම්

 ඔහු /ඇය අධ්‍යක්ෂ වශයෙන් හෝ ප්‍රධාන විධායක නිලධාරි / සාමාන්‍යාධිකාරි වශයෙන් සේවය කළ ආයතන වල නම්:

| ආයතනයේ නම | සේවා කාලය | තනතුර |
|---|---|---|
| | | |
| | | |
| | | |

4. ඉහත දැක් වූ තොරතුරු වඩාත් පැහැදිලි වීමට අදාළ වෙනත් විස්තර/ තොරතුරු සහ අයදුම්කරන රාජ්‍ය නොවන අධ්‍යක්ෂකවරයාගේ හෝ ප්‍රධාන විධායක නිලධාරියාගේ හෝ සාමාන්‍යාධිකාරිගේ හෝ එවැනි තනතුරක් සඳහා තේරීපත්වන පුද්ගලයෙකුගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා අදාළ වේ යැයි හැඟෙන වෙනත් තොරතුරු.

**ප්‍රකාශය**

ඉහත මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනුමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවටත් සම්පූර්ණ බවටත් තහවුරු කරමි. ඉහත සපයන ලද තොරතුරු වලට අදාළව, කිසියම් වෙනසක් වූ වහාම සියලු තොරතුරු බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයට සහ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් හට නිසි පරිදි දැනුවත් කරන බවට පොරොන්දු වෙමි.

ඉහත තනතුර දැරීම සඳහා කිසියම් නීතියකින් මා හට සීමාවන් පනවා නොමැති බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

දිනය: .........................................

.....................................................................
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරි / සාමාන්‍යාධිකාරි
හෝ එවැනි පත්වීමක් සඳහා තෝරා ගන්නා ලද
පුද්ගලයෙකුගේ අත්සන

**අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති විසින් සම්පූර්ණ කිරීම සඳහා**

ඉහත සපයන ලද තොරතුරු හා බැඳෙන වෙනත් පැහැදිලි කිරීම් / තොරතුරු සහ අධ්‍යක්ෂ හෝ ප්‍රධාන විධායක නිලධාරි හෝ සාමාන්‍යාධිකාරි හෝ එවැනි තනතුරක් සඳහා තෝරා ගන්නා ලද පුද්ගලයෙකු හෝ යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා අදාළ වේ යැයි හැඟෙන වෙනත් තොරතුරු

දිනය: ............................................ ....................................................

අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිගේ අත්සන

12 – 589/1

---

## 2017 අංක 02 රීතිය – ලියාපදිංචි ගාස්තුව

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ 23 වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

1. ආරම්භක ලියාපදිංචි ගාස්තුව

1.1. ජාතික මට්ටමේ සෑම ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක්ම ලියාපදිංචිය ලබා ගනු ලබන වර්ෂය සඳහා රුපියල් විසි දහසක (රු. 20,000/-) මූලික ලියාපදිංචි ගාස්තුවක්ද දිස්ත්‍රික් මට්ටමේ සෑම ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක්ම ලියාපදිංචිය ලබා ගනු ලබන වර්ෂය සඳහා රුපියල් දස දහසක (රු.10,000/-) මූලික ලියාපදිංචි ගාස්තුවක්ද ගෙවිය යුතු අතර එය ලියාපදිංචි ලබා ගන්නා දින හෝ ඊට පෙර රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය වෙත ගෙවිය යුතුය.

2. වාර්ෂික ලියාපදිංචි ගාස්තුව

2.1. සෑම ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක්ම ලියාපදිංචිය ලබාගත් පසුව එළඹෙන සෑම වර්ෂයක් සඳහාම පහත පරිදි සංවිධානයේ මුළු වත්කම් මත පාදක වූ ලියාපදිංචි ගාස්තුවක් ගෙවිය යුතු අතර එය අදාල වර්ෂයේ ජනවාරි 31 හෝ ඊට පෙර ගෙවිය යුතුය.

| පසුගිය වසර අවසාන දිනට මුලු වත්කම් එකතුව | වාර්ෂික ලියාපදිංචි ගාස්තුව (රු.) |
|---|---|
| රු. මිලියන 05ට අඩු | 5,000/- |
| රු. මිලියන 5 සිට රු. මිලියන 10 දක්වා | 7,500/- |
| රු. මිලියන 10 සිට රු. මිලියන 15 දක්වා | 10,000/- |
| රු. මිලියන 15 සිට රු. මිලියන 20 දක්වා | 12,500/- |
| රු. මිලියන 20 සිට රු. මිලියන 50 දක්වා | 15,000/- |
| රු. මිලියන 50ට ඉහල | 20,000/- |

*ශාක්‍ය නානායක්කාර*
අධ්‍යක්ෂ ජනරාල්/ රෙජිස්ට්‍රාර්
රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

12 – 589/2

## 2017 අංක 03 රීතිය – අවම මූලික ප්‍රාග්ධනය

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ 23 වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

1. අවම මූලික ප්‍රාග්ධනය

1.1 **2018 ජනවාරි 15 දින හෝ ඊට පෙර බලපත්‍රය සඳහා අයදුම් කරනු ලබන සංවිධාන**
ජාතික මට්ටමේ සෑම ලියාපදිංචි ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් විසින්ම සෑම විටම රුපියල් මිලියන පහකට (රු. 5,000,000/-) නොඅඩු මූලික ප්‍රාග්ධනයක්ද, දිස්ත්‍රික් මට්ටමේ සෑම ලියාපදිංචි ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් විසින්ම සෑමවිටම රුපියල් මිලියන දෙකකට (රු. 2,000,000/-) නොඅඩු මූලික ප්‍රාග්ධනයක්ද පවත්වා ගත යුතුය.

2. අනුකූල නොවන අවස්ථාවකදී නීතිමය ක්‍රියාමාර්ග

2.1 ලියාපදිංචි ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් මෙම විධාන වලට අනුකූල නොවනවිටදී,
(අ) මෙම විධානයන්ට අනුකූල නොවන බවට තහවුරු කරගත් මාසයේ අවසාන දිනට පැවති මුළු තැන්පතු සහ ලබාගත් ණය ප්‍රමාණයේ ශේෂයට සීමා විය යුතුය.
(ආ) අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරන තෙක් සහ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්/ රෙජිස්ට්‍රාර් විසින් ඒ සම්බන්ධව සෑහීමකට පත්වන බවට තහවුරු කරන තෙක් ලියාපදිංචි ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් විසින් ලාභාංශ නොගෙවිය යුතුය.

3. රාජ්‍ය නොවන සංවිධානයක මූලික ප්‍රාග්ධනය

3.1 රාජ්‍ය නොවන සංවිධානයක මූලික ප්‍රාග්ධනයට පහත සඳහන් දේ ඇතුළත් විය යුතුය.
(අ) නිකුතු සහ සම්පූර්ණයෙන් ගෙවා නිමි කොටස් (මුදලට)
(ආ. ආධාර
(ඇ) පොදු සංචිත
(ඈ) අනිවාර්ය සංචිත
(ඉ) අවසන් වරට විගණිත ගිණුම් ප්‍රකාශයේ සඳහන් රඳවාගත් ලාභය හෝ පාඩුව
(ඊ) පවත්නා වර්ෂයේ ප්‍රකාශයට පත් නොකළ ලාභය (අලාභය)

*ශාක්‍ය නානායක්කාර*
අධ්‍යක්ෂ ජනරාල්/ රෙජිස්ට්‍රාර්
රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

12 – 589/3

---

## 2017 අංක 04 රීතිය – ක්‍රියාකාරකම් වර්ග

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ 23 වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

1. ක්‍රියාකාරකම් වර්ග

1.1 සෑම ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක්ම පහත ක්‍රියාකාරකම් වල නිරත වීම සඳහා සුදුසුකම් ලබන අතර ඒ සඳහා රෙජිස්ට්‍රාර්වරයාගේ මූලික අනුමැතිය ලබා තිබිය යුතුය.

(අ) ඇපකර (සුරැකුම්) සහිතව හෝ රහිතව මූල්‍ය පහසුකම් සැපයීම

(ආ) සීමිත ඉතුරුම් තැන්පතු ණය ගැනුම්කරුවන්ගෙන් පමණක් ලබා ගැනීම

(ඇ) ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන මඟින් දෙන ලද ණය සහ අත්තිකාරම් සුරක්ෂිත කිරීමේ කාර්යය සඳහා ඕනෑම ආකාරයක චංචල හෝ නිශ්චල දේපල ඔඩපනය කිරීම, උකස් කිරීම, ඇපයට තැබීම හෝ පැවරීම

(ඈ) මුදල් විචක්ෂණශීලීව ආයෝජනය කිරීම

(ඉ) කුඩා ව්‍යාපාර හා ස්වයං රැකියා ව්‍යාපෘති වල ආයෝජනය කිරීම පිළිබඳව තම ගණුදෙනු කරුවන්ට වෘත්තීය උපදෙස් සැපයීම

(ඊ) කළමනාකරණ, අලෙවිකරණ, තාක්ෂණික සහ පරිපාලන උපදෙස් ලබා දීම සහ එම ක්ෂේත්‍රවල සේවා ලබා ගැනීම සඳහා ගණුදෙනුකරුවන්ට සහාය වීම.

( උ) ණුදෙනුකරුවන්ට පුහුණුව ලබා දීම

(ඌ) අදාළ අධිකාරියේ නීති හා නියෝග වලට යටත්ව සහ අවශ්‍ය බලපත්‍රය හෝ අනුමැතිය ලබාගත් පසු උකස් ගැනීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

(එ) රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමැතිය ලබා දෙනු ලබන අනෙකුත් ව්‍යාපාරවල නියැලීම

*ශාක්‍ය නානායක්කාර*
අධ්‍යක්ෂ ජනරාල්/ රෙජිස්ට්‍රාර්
රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

12 – 589/4

---

**2017 අංක 05 රීතිය – ව්‍යවස්ථාපිත සංචිත**

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ 23 වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

1. ව්‍යවස්ථාපිත සංචිත

1.1 සෑම ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක්ම ව්‍යවස්ථාපිත සංචිතයක් පවත්වා ගත යුතු අතර සෑම වසරකම ශුද්ධ ලාභයෙන් බදු මුදල් ගෙවීමෙන් පසු,

ක්ෂුද්‍ර මූල්‍ය සංවිධානයේ ලාභයෙන් සියයට පහකට (5%) නොඅඩු ප්‍රමාණයක් එම සංචිත අරමුදලට මාරු කළ යුතුය.

*ශාක්‍ය නානායක්කාර*
අධ්‍යක්ෂ ජනරාල්/ රෙජිස්ට්‍රාර්
රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

12 – 589/5

---

**2017 අංක 06 රීතිය – තැන්පතු**

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ 23 වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

1. තැන්පතු සඳහා වන සීමාවන්

1.1. සෑම ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක්ම සීමිත ඉතුරුම් තැන්පතු පමණක් භාර ගත යුතුය.

''සීමිත ඉතුරුම් තැන්පතු'', යනුවෙන් අදහස් වන්නේ ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන මඟින් දෙන ලද ණය මුදලකට එරෙහිව සුරැකුම් තැන්පතුවක් ලෙස හෝ මුදල් ඇපයක් ලෙස ණය ගැණුම්කරුවෙකුගෙන් ලද ඉතුරුම් තැන්පතුය.

2. සීමිත ඉතුරුම් තැන්පතු

2.1. සෑම අවස්ථාවකදීම ණුදෙනුකරුවා ශුද්ධ ණය ගැනුම්කරුවෙක් ලෙස රැඳෙන බව තහවුරු වන පරිදි යම් ණය මුදලකට එරෙහිව තබන සුරැකුම් තැන්පතුවකට හෝ මුදල් ඇපයකට අදාළ උපරිම ප්‍රතිශතය ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානය විසින් තීරණය කළ යුතුය. එසේ නමුත් අනුයාත වශයෙන් ණය මුදලක් ලබා ගත්තේ නම්, ශුද්ධ ණය ගැනුම්කරුගේ තත්වය අහිමි වූ දින සිට උපරිම වශයෙන් මාස හයක (06) කාලයක් දක්වා මෙම අවශ්‍යතාවය එම ණය ගැනුම්කරුවන්ට අදාළ නොවේ.

2.2. එය සීමිත ඉතුරුම් තැන්පතු වලින් අවම වශයෙන් සියයට පහක (5%) ප්‍රමාණයක් සියලුම රාජ්‍ය නොවන ක්ෂුද්‍ර මූල්‍ය සංවිධාන විසින් බලපත්‍රලාභී වානිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂ බැංකුවක තැන්පත් කළ යුතුය.

2.3. ක්ෂුද්‍ර මූල්‍ය සංවිධානයක ඉහත 2.2 කොටසෙහි සඳහන් බලපත්‍රලාභී වානිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂ බැංකුවක ඇති තැන්පතු ප්‍රමාණය මුළු සීමිත ඉතුරුම් තැන්පතු ප්‍රමාණයෙන් අඩුකළ විට ලැබෙන ප්‍රමාණය මුළු ක්‍රමික ණය ප්‍රමාණයට වඩා සෑම විටම වැඩි විය යුතුය.

මුළු ක්‍රමික ණය > (මුළු සීමිත ඉතුරුම් තැන්පතු - ඉහත 2.2 කොටසෙහි සඳහන් බලපත්‍රලාභී වානිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂ බැංකුවක ඇති තැන්පතු)

3. දිරිගැන්වීමේ වැඩසටහන් මත වන වාරණයන්

3.1. තැන්පතු සඳහා පෙළඹවීමක් වශයෙන් කිසිඳු ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයකට දිරි ගැන්වීමේ උපක්‍රම භාවිතා කළ නොහැක. මේ සඳහා ''දිරි ගැන්වීමේ උපක්‍රම'' යනුවෙන් අදහස් වන්නේ, තැන්පතු කරුවන් වෙත පොළියට අමතරව මූල්‍යමය වශයෙන් හෝ ද්‍රව්‍යමය වශයෙන් යම් ප්‍රතිලාභයක් පිරිනැමීමයි.

4. සංක්‍රාන්ති කාලය

4.1. 2016/07/14 දිනට පෙර සීමිත ඉතුරුම් තැන්පතුවලට අමතරව ඉතුරුම් තැන්පතු භාර ගත් සියලුම ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන වහාම එම තැන්පතු භාර ගැනීම නතර කර එම තැන්පතු පිළිබඳව ප්‍රකාශනයක් රෙජිස්ට්‍රාර් වෙත ලබා දිය යුතුයි. එම ප්‍රකාශිත ඉතුරුම් තැන්පතු පහත සඳහන් පරිදි ගෙවා අවසන් කළ යුතුය.

(i) තැන්පතු වලින් 20% ක් 2018.12.31 දිනට පෙර
(ii) ඉතිරි තැන්පතු වලින් 40% ක් 2019.12.31 දිනට පෙර
(iii) එම ඉතිරි තැන්පතු වල ශේෂයෙන් 40% ක් 2020.12.31 දිනට පෙර
(iv) අවසාන ශේෂය 2021.12.31 දිනට පෙර

*ශාක්‍ය නානායක්කාර*
අධ්‍යක්ෂ ජනරාල්/ රෙජිස්ට්‍රාර්
රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය.

12 – 589/6

---

## 2017 අංක 07 රීතිය – අධක්ෂකවරුන්ගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ/සාමාන්‍යාධිකාරිගේ සුදුසුකම් සහ සහයෝගීතාවය පිළිබඳ තක්සේරුව

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ 23 වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

1. සුදුසුකම් සහ සහයෝගීතාවය පිළිබඳ තක්සේරුව සඳහා නිර්නායකයන්

1.1. පුද්ගලයෙකු පහත කරුණුවලට යටත් වන්නේ නම්, එම පුද්ගලයා ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක අධ්‍යක්ෂකවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියකු/සාමාන්‍යාධිකාරිවරයෙකු ලෙස පත්කිරීමට හෝ තෝරා ගැනීමට නොහැකිය.

(අ) අධ්‍යාපන සුදුසුකම් හෝ වෘත්තීය සුදුසුකම් හෝ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර, බැංකු කටයුතු, මූල්‍ය, නීතිමය හෝ පරිපාලන හෝ ඊට අදාළ වෙනත් අංශයකින් ක්‍රියාකාරී පළපුරුද්දක් නොතිබීම.

(ආ) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පොලිසියක්, යම් නියාමන හෝ අධීක්ෂණ අධිකාරයක්, වෘත්තියවේදීන්ගේ සංගමයක්, විමර්ශන කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක්, හෝ වෙනත් නීතිමය ආයතනයක් මගින් යම් වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් සිදු කරනු ලබන විමර්ශනයකට හෝ විභාග කිරීමකට භාජනය වී තිබීම.

(ඇ) වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් හෝ ඕනෑම නීතියක් හෝ ඒ යටතේ නිකුත් කරන ලද්දා වූ, රීති, රෙගුලාසි, විධාන හෝ නිර්ණයන්ට අනුකූල නොවීම වැනි ක්‍රියාවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ හෝ විදේශයක නීති මඟින් පිහිටුවන ලද අධිකරණයකින්, නියාමන හෝ අධීක්ෂණ අධිකාරයකින්,

වෘත්තියවේදීන්ගේ සංගමයකින්, විමර්ශන කොමිෂන් සභාවකින්, විනිශ්චය සභාවකින් හෝ වෙනත් මණ්ඩලයකින් වැරදිකරුවෙකු හෝ එකී ක්‍රියාවට සම්බන්ධ පාර්ශවයක් ලෙස හඳුනාගෙන වැරදිකරුවකු වී තිබීම.

(ඈ) වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් සම්බන්ධයෙන් වන වරදකට අධිකරණයකින් වැරදිකරු වී හෝ එවැනි වරදක් සම්බන්ධයෙන් අධිකරණයකින් චෝදනා ලබා තිබීම.

(ඉ) කිසියම් අධිකරණයකින් සදාචාර විරෝධී ක්‍රියාවකට සම්බන්ධ වරදකට වැරදිකරුවකු වීම.

(ඊ) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක කිසියම් අධිකරණයකින් වස්තු භංගත්වයට හෝ බංකොලොත් භාවයට පත් බවට ප්‍රකාශ කර තිබීම.

(උ) ණය ආපසු ගෙවීමට අධිකරණයකින් දෙන ලද නියෝගයකින් හෝ ආඥාවක් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම හෝ පැහැර හැර තිබීම.

(ඌ) නියාමන හෝ අධීක්ෂණ අධිකාරයක් විසින්, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක කිසියම් ආයතනයක අධ්‍යක්ෂ, ප්‍රධාන විධායක නිලධාරි හෝ වෙනත් නිලධාරියකු ලෙස සේවයෙන් ඉවත් කිරීම හෝ සේවය අත්හිටුවීම.

(එ) අධිකරණයක් මගින් සිහි විකල් වූ පුද්ගලයකු ලෙස ප්‍රකාශ කිරීම.

(ඒ) (i) නියාමන හේතුමත බලපත්‍රය හෝ ව්‍යාපාරය අවලංගු කරනු ලැබූ හෝ අත්හිටුවනු ලැබූ හෝ

(ii) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක දී ඈවර වූ හෝ ඈවර වෙමින් පවතින හෝ අනිවාර්යය ඈවර කිරීමකට යටත්ව සිටින්නා වූ ඕනෑම බලපත්‍රලාභී බැංකුවක, බැංකු නොවන මූල්‍ය ආයතනයක, අධ්‍යක්ෂවරයෙකු, ප්‍රධාන විධායක නිලධාරියකු හෝ වෙනත් බලතල සහිත තනතුරක් දරා සිටීම.

(ඔ) වෙනත් ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක ප්‍රධාන විධායක නිලධාරියෙකු හෝ සේවා නියුක්තිකයකු වීම.

2. සුදුසුකම් සහ යෝග්‍යත්වය පිළිබඳ තක්සේරු කිරීමේදී අනුගමනය කළයුතු ක්‍රියාමාර්ගය

2.1. සෑම ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක්ම අධ්‍යක්ෂ හෝ ප්‍රධාන විධායක නිලධාරි/ සාමාන්‍යාධිකාරි ලෙස පත්වීම සඳහා තෝරාගත් පුද්ගලයන්ගේ දිවුරුම් ප්‍රකාශයක් සහ ප්‍රකාශයක් පිළිවෙලින් ඇමුණුම් I සහ II අනුව රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතුය.

2.2. ඉහත සඳහන් කරුණට අමතරව, පළමු පත්වීම ලබන විටදී ඔහු/ ඇය විසින් මෙම පත්වීමට පෙර සේවය කළ සේවා ස්ථානයේ ඔහුට/ ඇයට පැවරී තිබූ රාජකාරිවල කාර්ය සාධන මට්ටම පිළිබඳ සේවා යෝජකයා නිකුත් කල ලිපියක් පත්වීමට පෙර රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතුය.

2.3. යම් ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් විසින් තම අධ්‍යක්ෂ ධූරයෙහි තවදුරටත් රැඳී සිටින අධ්‍යක්ෂකවරුන්ට අදාළව වාර්ෂිකව දිවුරුම් ප්‍රකාශ සහ ප්‍රකාශයන් තම වාර්ෂික මහ සභා රැස්වීමට මාසයකට පෙර රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතුය.

3. අධ්‍යක්ෂගේ අනුමැතිය

3.1. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ රෙජිස්ට්‍රාර් ඉහත විධාන අංක 1 හි සඳහන් කරුණු සැලකිල්ලට ගෙන ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක අධ්‍යක්ෂවරයෙකුගේ හෝ ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී වරයෙකුගේ පත්වීම හෝ නැවත පත්කිරීම අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම කරනු ඇත.

3.2. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ රෙජිස්ට්‍රාර් විසින් ඉහත අනුමැතිය හෝ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධව (ප්‍රතික්ෂේප කිරීමකදී එයට බලපාන ලද

කරුණු ද සමඟින්) අදාළ ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානය දැනුවත් කරන අතර, ඒ සම්බන්ධව අදාල අධ්‍යක්ෂ හෝ ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී ගේ සැලකිල්ලට යොමුකිරීම සහ එම දැන්වීම ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීම එම ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයේ වගකීමකි.

4. පත්වීමෙන් පසුව වන නුසුදුසුකම් දැනුම්දීම

4.1. සෑම ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක්ම එම සංවිධානයට පත් වූ අධ්‍යක්ෂ හෝ ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී හෝ සම්බන්ධව ඔහු / ඇය එම තනතුරට උචිත සහ යෝග්‍ය නොවන බවට සාධාරණ සැකයක් හෝ හේතු කාරණා ඇති වූ විට, එම කරුණු ගැන දැනුවත්වී දින දහහතරක් (14) ඇතුළත ඒ පිළිබඳව රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ රෙජිස්ට්‍රාර් වෙත දැනුම්දිය යුතුය.

4.2. ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක යම් අධ්‍යක්ෂවරයෙක් හෝ ප්‍රධාන විධායක නිලධාරිවරයෙක් / සාමාන්‍යාධිකාරිවරයෙක් විසින් ඉදිරිපත් කළ දිවුරුම් ප්‍රකාශයේ හෝ ප්‍රකාශයේ සඳහන් තොරතුරු වෙනස්වූ, වෙනස්කල, වලංගු නැති, අදාළ නොවන හෝ සාවද්‍ය බව හෙලිවුවහොත්, ඒ සම්බන්ධව දින දහහතරක් (14) ඇතුළත රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ රෙජිස්ට්‍රාර් දැනුවත් කළ යුතුය.

5. ඕනෑම අවස්ථාවක රෙජිස්ට්‍රාර් මඟින් තීරණ ගැනීම

5.1. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ රෙජිස්ට්‍රාර් විසින් යම් ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක අධ්‍යක්ෂවරයෙක් හෝ ප්‍රධාන විධායක නිලධාරිවරයෙක්/ සාමාන්‍යාධිකාරිවරයෙක් එම තනතුරෙහි රඳවා තබා ගැනීමට නුසුදුසු සහ යෝග්‍ය නොවන බවට හඳුනාගත් විට එම අධ්‍යක්ෂවරයා හෝ ප්‍රධාන විධායක නිලධාරියා/සාමාන්‍යාධිකාරි පිළිබඳව විධාන අංක 3.2 හි සඳහන් කරුණු උපයෝගී කරගනිමින් තීරණ ගනු ඇත.

**ශාක්‍ය නානායක්කාර**
අධ්‍යක්ෂ ජනරාල් / රෙජිස්ට්‍රාර්
රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය.

**1(ඒ) උපලේඛනය**

අධ්‍යක්ෂවරයකු/ප්‍රධාන විධායක නිලධාරිවරයකු/ප්‍රධාන කළමනාකරුවකු එවැනි පත්වීමක් සඳහා තෝරාගන්නා ලද පුද්ගලයකු විසින් ඉදිරිපත් කළ යුතු දිවුරුම් ප්‍රකාශයේ ආකෘතිය

## දිවුරුම් ප්‍රකාශය

.......................................................................................................................................................
(ලිපිනය) හි පදිංචි ........................................................................................ හැඳුනුම්පත් අංක/ගමන් බලපත්‍ර අංක දරන
........................................................................................................................ (සම්පූර්ණ නම) වන මම
බෞද්ධ/හින්දු/ක්‍රිස්තියානි/කතෝලික/මුස්ලිම් ආගමිකයකු වශයෙන් ගාම්භීර පූර්වකව ද, අවංකව ද, සත්‍යාවාදීව ද මෙසේ සහතික කරමින් ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.[1]

1. ........................................................................................ ඉහත නම සඳහන් ප්‍රතිඥාකරු/දිවුරුම්කරු මම වෙමි.
2. ........................................................................................................................ (තනතුර) වන මම
   ................................................................................................ (රාජ්‍ය නොවන සංවිධානයේ නම)
   ආයතනයේ ........................................................................................................ (තනතුර) ලෙස
   පත්කිරීමට තේරී පත්වී ඇත.
3. මාහට අදාළ ක්ෂේත්‍රයන්හි පහත සඳහන් අධ්‍යාපනික සහ/හෝ වෘත්තීමය සුදුසුකම් ඇති බවට ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.
   ..........................................................................................................................................
   ..........................................................................................................................................
   ..........................................................................................................................................

4. මාහට පහත සඳහන් පරිදි ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර බැංකු කටයුතු මූල්‍යමය කටයුතු නීතිමය හෝ පරිපාලනමය හෝ වෙනත් අදාළ විෂයයන් පිළිබඳව මනා පළපුරුද්දක් ඇති බවට ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.

..................................................................................................................................................................

..................................................................................................................................................................

..................................................................................................................................................................

5. මම ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පොලීසියක්, යම් නියාමන හෝ අධීක්ෂණ අධිකාරයක්, වෘත්තීයවේදීන්ගේ සංගමයක්, විමර්ශණ කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක්, වෙනත් නීතිමය ආයතනයක් මගින් යම් වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් පිළිබඳව සිදු කරනු ලබන විමර්ෂණයකට හෝ විභාග කිරීමකට භාජනය වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.

6. මම වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් හෝ ඕනෑම නීතියක් හෝ ඒ යටතේ නිකුත් කරන ලද්දා වූ, රීති, රෙගුලාසි විධාන හෝ නිර්ණයන්ට අනුකූල නොවීම වැනි ක්‍රියාවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ හෝ විදේශයක නීති මඟින් පිහිටුවන ලද අධිකරණයකින්, නියාමන හෝ අධීක්ෂණ අධිකාරයකින්, වෘත්තීයවේදීන්ගේ සංගමයකින්, විමර්ශණ කොමිෂන් සභාවකින් හෝ වෙනත් මණ්ඩලයකින් වැරදිකරුවෙකු හෝ එකී ක්‍රියාවට සම්බන්ධ පාර්ශවක් ලෙස හඳුනාගෙන වැරදිකරුවෙකු වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.

7. මම වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් සම්බන්ධයෙන් වන චෝදනා වරදකට අධිකරණයකින් දඬුවම් ලබා නොමැති බවට ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.

8. මම කිසියම් අධිකරණයකින් සදාචාර විරෝධී ක්‍රියාවකට සම්බන්ධ වරදකට වැරදිකරු වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.

9. මම ශ්‍රී ලංකාවේ හෝ විදේශයක කිසියම් අධිකරණයකින් වස්තු භංගත්වයට හෝ බංකොලොත් භාවයට පත් බවට ප්‍රකාශ කර නොමැති බවට ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.

10. මම ණය ආපසු ගෙවීමට කිසියම් අධිකරණයකින් දෙන ලද නියෝගයක් හෝ ආඥාවක් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.

11. මම නියාමන හෝ අධීක්ෂණ අධිකාරයක් විසින්, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක කිසියම් ආයතනයක අධ්‍යක්ෂ, ප්‍රධාන විධායක නිලධාරීන් හෝ වෙනත් නිලධාරියෙකු ලෙස සේවයෙන් ඉවත්කර හෝ සේවය අත්හිටුවා නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.

12. මම අධිකරණයක් මඟින් සිහිවිකල් වූ පුද්ගලයෙකු ලෙස ප්‍රකාශයට පත්වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.

13. මම

(අ) නියාමන හේතුන් මත බලපත්‍රය හෝ ව්‍යාපාරය අවලංගු කරනු ලැබූ හෝ අත්හිටුවනු ලැබූ හෝ

(ආ) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක ඇවර වූ හෝ ඇවර වෙමින් පවතින් හෝ අනිවාර්ය ඇවර කිරීමකට යටත්ව සිටින්නා වූ ඕනෑම බලපත්‍රලාභී බැංකුවක, බැංකු නොවන මූල්‍ය ආයතනයක, අධ්‍යක්ෂවරයෙකු, ප්‍රධාන විධායක නිලධාරියෙකු හෝ වෙනත් බලතල සහිත තනතුරක් දරා නොමැති බවට ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.

14. මම වෙනත් බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක/සමාගමක අධ්‍යක්ෂවරයෙක් හෝ සේවා නියුක්තිකයකු නොවන බවට ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.

| |
|---|
| අදාළ පරිදි<br>මුද්දර අලවන්න. |

මෙම දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කරුණු ප්‍රතිඥාකරුට/දිවුරුම්කරුට කියවා තේරුම්කර දුන් අතර ඔහු/ඇය එම කරුණු සත්‍ය බවට පිළිගෙන ප්‍රතිඥා දී/දිවුරුම් දී .................. දින ............... දී මා ඉදිරිපිට දී අත්සන් තබන ලදී.

මා ඉදිරිපිටදී

සාමදාන විනිශ්චයකාර/
දිවුරුම් කොමසාරිස්

සටහන 1. – අදාළ නොවන වචන කපා හරින්න.

ක්‍රිස්තියානි හෝ කතෝලික පුද්ගලයන් දිවුරා ප්‍රකාශ කර සිටිය යුතු අතර බෞද්ධ, හින්දු, මුස්ලිම් සහ වෙනත් ආගම් අදහන පුද්ගලයන් සහතික කරමින් ප්‍රතිඥා දිය යුතුය.

1(බී) උපලේඛනය

රාජ්‍ය නොවන සංවිධානයේ නම: ..........................................................................................................

**අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී එවැනි පත්වීමක් සඳහා**
**තෝරා ගන්නා ලද පුද්ගලයෙක් විසින් ඉදිරිපත් කළ යුතු ප්‍රකාශය**
(........................ දිනට අදාළ ඇමුණුම් සහිතව)

1. **පුද්ගලික තොරතුරු**

   1.1 සම්පූර්ණ නම: ..........................................................................................................
   1.2 ජාතික හැඳුනුම්පත් අංකය: ..........................................................................................................
   1.3 විදේශ ගමන් බලපත්‍ර අංකය: ..........................................................................................................
   1.4 උපන් දිනය: ..........................................................................................................
   1.5 ස්ථිර ලිපිනය: ..........................................................................................................
   1.6 වර්තමාන ලිපිනය: ..........................................................................................................

2. **අයදුම්කරන රාජ්‍ය නොවන සංවිධානයේ පත්වීම**

   2.1 මණ්ඩලයට/වර්තමාන තනතුරට පත්වූ දිනය: ..........................................................................................................
   2.2 තනතුර: ..........................................................................................................
   2.3 දේශීය හෝ විදේශික බව: ..........................................................................................................
   2.4 වාර්ෂික වේතනය (විස්තර සහිතව): ..........................................................................................................
   2.5 රා. නො. සංවිධානයෙන් ලැබෙන වෙනත් ප්‍රතිලාභ: ..........................................................................................................

3. **පසුබිම සහ අත්දැකීම්**

   ඔහු/ඇය අධ්‍යක්ෂ වශයෙන් හෝ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී වශයෙන් සේවය කළ ආයතනවල නම්:

| ආයතනයේ නම | සේවා කාලය | තනතුර |
|---|---|---|
| | | |
| | | |
| | | |

4. ඉහත දැක්වූ තොරතුරු වඩාත් පැහැදිලිවීමට අදාළ වෙනත් විස්තර/තොරතුරු සහ අයදුම්කරන රාජ්‍ය නොවන ස. අධ්‍යක්ෂවරයාගේ හෝ ප්‍රධාන විධායක නිලධාරියාගේ හෝ සාමාන්‍යාධිකාරිගේ හෝ එවැනි තනතුරක් සඳහා තේරීපත්වන පුද්ගලයෙකුගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා අදාළ වේ යැයි හැඟෙන වෙනත් තොරතුරු.

ප්‍රකාශය

ඉහත මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනුමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවටත්, සම්පූර්ණ බවටත් තහවුරු කරමි. ඉහත සපයන ලද තොරතුරුවලට අදාළව, කිසියම් වෙනසක් වූ වහාම සියලු තොරතුරු බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයට සහ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්හට නිසි පරිදි දැනුවත් කරන බවට පොරොන්දු වෙමි.

ඉහත තනතුරු දැරීම සඳහා කිසියම් නීතියකින් මාහට සීමාවන් පනවා නොමැති බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

දිනය: ...................................

........................................................
අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී/
සාමාන්‍යාධිකාරී හෝ එවැනි පත්වීමක්
සඳහා තෝරා ගන්නා ලද
පුද්ගලයෙකුගේ අත්සන

**අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති විසින් සම්පූර්ණ කිරීම සඳහා**

ඉහත සපයන ලද තොරතුරු හා බැඳෙන වෙනත් පැහැදිලි කිරීම්/තොරතුරු සහ අධ්‍යක්ෂ හෝ ප්‍රධාන විධායක නිලධාරි හෝ සාමාන්‍යාධිකාරි හෝ එවැනි තනතුරක් සඳහා තෝරා ගන්නා ලද පුද්ගලයෙකු හෝ යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා අදාළ වේ යැයි හැඟෙන වෙනත් තොරතුරු

දිනය: ...................................

.......................................................
අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිගේ අත්සන

12 – 589/7

---

**2017 අංක 08 රීතිය – අවම ද්‍රවශීල වත්කම් අනුපාතිකයක් පවත්වා ගැනීම**

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ 23 වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

1. අවම ද්‍රවශීල වත්කම් අනුපාතිකය

1.1. සෑම ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක්ම සෑම විටම ද්‍රවශීල වත්කම්වල එකතුවේ සාමාන්‍යය මාසික මුළු තැන්පතු වගකීම්වල එකතුවෙන් සියයට දහයකට (10%) නොඅඩු විය යුතුය.

1.2 ද්‍රවශීල වත්කම් අනුපාතිකය (ද්‍ර. ව. අ.) ගණනය කිරීම පහත සඳහන් සූත්‍රය පදනම් කරගෙන කළ යුතුය. ද්‍රවශීල වත්කම් අනුපාතිකය ගණනය කිරීම සවිස්තරව ඇමුණුමෙහි දක්වා ඇත.

$$\text{ද්‍රවශීල වත්කම් අනුපාතිකය} = \frac{\text{ද්‍රවශීල වත්කම් එකතුවේ සාමාන්‍ය}*100}{\text{මුළු තැන්පතු වගකීම්}}$$

2. මුළු සාමාන්‍ය ද්‍රවශීල වත්කම් එකතුව

2.1. සෑම ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක්ම පවත්වා ගනු ලබන කාලය සඳහා පහත වත්කම්හි දෛනික සාමාන්‍යය එකතු කිරීමෙන් මුළු සාමාන්‍ය ද්‍රවශීල වත්කම් ගණනය කළ යුතුය.

(අ) අතැති මුදල්

(ආ) යම් බැංකුකරුවෙකුගේ ලියුමකින් හෝ අයකිරීමකින් නිදහස් වාණිජ බැංකුවල ඇති ජංගම ගිණුමෙහි ශේෂය

(ඇ) යම් බැංකුකරුවෙකුගේ ලියුමකින් හෝ අයකිරීමකින් නිදහස් වාණිජ බැංකුවල ඇති තැන්පතු ගිණුමෙහි ශේෂය

(ඈ) යම් බැංකුකරුවෙකුගේ ලියුමකින් හෝ අයකිරීමකින් නිදහස් විශේෂිත බැංකුවල පවත්වාගෙන යනු ලබන තැන්පතු ගිණුමෙහි ශේෂය

(ඉ) යම් බැංකුකරුවෙකුගේ ලියුමකින් හෝ අයකිරීමකින් නිදහස් ශ්‍රී ලංකා ආණ්ඩුවේ භාණ්ඩාගාර බිල්පත්

(ඊ) යම් බැංකුකරුවෙකුගේ ලියුමකින් හෝ අයකිරීමකින් නිදහස් අවුරුද්දක් තුළ කල්පිරෙන ශ්‍රී ලංකා ආණ්ඩුවේ භාණ්ඩාගාර බැඳුම්කර

(උ) යම් බැංකුකරුවෙකුගේ ලියුමකින් හෝ අයකිරීමකින් නිදහස් අවුරුද්දක් තුළ කල්පිරෙන ශ්‍රී ලංකා ආණ්ඩුවේ සුරැකුම්පත්

(ඌ) යම් බැංකුකරුවෙකුගේ ලියුමකින් හෝ අයකිරීමකින් නිදහස් අවුරුද්දක් තුළ කල්පිරෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ සුරැකුම්පත්

(එ) යම් බැංකුකරුවෙකුගේ ලියුමකින් හෝ අයකිරීමකින් නිදහස් අවුරුද්දක් තුළ කල්පිරෙන ප්‍රතිමිලදීගැනීම් ගිවිසුම්ගත භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර

3. අධීක්ෂණ මැදිහත්වීම් සහ අවම අවශ්‍යතාවයන් තහවුරු කරගැනීමේ පියවර

3.1. ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක ද්‍රවශීලතාවය, පවත්වා ගත යුතු අවම අවශ්‍යතාවයට වඩා අඩුවීම වළක්වා ගැනීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය ක්ෂණිකව මැදිහත් වනු ඇත.

3.2 ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් විධාන 1 හි පරිදි අවම ද්‍රවශීල අවශ්‍යතාවය පවත්වා ගැනීමට අපොහොසත් වුවහොත් එම අවම අවශ්‍යතාවය සපුරන තෙක් සහ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ රෙජිස්ට්‍රාර් ඒ බව ස්ථිර කරන තෙක්, එම සමාගම විසින් එක් දිනකට ද්‍රවශීලතා හිඟයෙහි වටිනාකමින් සියයට දශම එකක් (0.1%) හෝ රුපියල් දසදහසක් (රු.10,000/-) යන දෙකෙන් අඩු මුදල රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයට ගෙවිය යුතුය.

4. නියාමන වාර්තා කිරීම

4.1. සෑම ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයකක්ම මේ සමඟ ඇති වාර්තා කිරීමේ ආකෘතිය උපයෝගී කරගනිමින් මාසිකව, සෑම මසක්ම අවසාන වී ඊළඟ දින 15ක් ඇතුලත ද්‍රවශීල වත්කම් අනුපාතිකය පිළිබඳ වාර්තාවක් රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතුය.

*ශාක්‍ය නානායක්කාර*
අධ්‍යක්ෂ ජනරාල්/ රෙජිස්ට්‍රාර්
රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

ඇමුණුම

.

........................................................................................................................................................ වෙතින්

අධ්‍යක්ෂ ජනරාල්/රෙජිස්ට්‍රාර්, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය වෙත

**ද්‍රවශීල වත්කම් අනුපාතිකය**

| | රු.'000 |
|---|---|
| 1. ........................ මාසයේ අවසාන වැඩ කරන දිනට මුලු තැන්පතු (පදනම් දිනය) | ................. |
| 2. ........................ මාසය සඳහා වන ද්‍රවශීල වත්කම් වල සාමාන්‍යය. (පවත්වාගනු ලබන කාලය) | ................. |
| (අ) අතැති මුදල් | |
| (ආ) යම් බැංකුකරුවෙකුගේ ලියුමකින් හෝ අයකිරීමකින් නිදහස් වාණිජ බැංකුවල ඇති ජංගම ගිණුමෙහි ශේෂය | ................. |
| (ඇ) යම් බැංකුකරුවෙකුගේ ලියුමකින් හෝ අයකිරීමකින් නිදහස් වාණිජ බැංකුවල ඇති තැන්පතු ගිණුමෙහි ශේෂය | ................. |
| (ඈ) යම් බැංකුකරුවෙකුගේ ලියුමකින් හෝ අයකිරීමකින් නිදහස් විශේෂිත බැංකුවල පවත්වාගෙන යනු ලබන තැන්පතු ගිණුමෙහි ශේෂය | ................. |
| (ඉ) යම් බැංකුකරුවෙකුගේ ලියුමකින් හෝ අයකිරීමකින් නිදහස් ශ්‍රී ලංකා ආණ්ඩුවේ භාණ්ඩාගාර බිල්පත් | ................. |
| (ඊ) යම් බැංකුකරුවෙකුගේ ලියුමකින් හෝ අයකිරීමකින් නිදහස් අවුරුද්දක් තුළ කල්පිරෙන ශ්‍රී ලංකා ආණ්ඩුවේ භාණ්ඩාගාර බැඳුම්කර | ................. |
| (උ) යම් බැංකුකරුවෙකුගේ ලියුමකින් හෝ අයකිරීමකින් නිදහස් අවුරුද්දක් තුළ කල්පිරෙන ශ්‍රී ලංකා ආණ්ඩුවේ සුරැකුම්පත් | ................. |
| (ඌ) යම් බැංකුකරුවෙකුගේ ලියුමකින් හෝ අයකිරීමකින් නිදහස් අවුරුද්දක් තුළ කල්පිරෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ සුරැකුම්පත් | ................. |
| (එ) යම් බැංකුකරුවෙකුගේ ලියුමකින් හෝ අයකිරීමකින් නිදහස් අවුරුද්දක් තුළ කල්පිරෙන ප්‍රතිමිලදිගැනීම් ගිවිසුම්ගත භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | ................. |
| 3. ද්‍රවශීල වත්කම් අනුපාතය (2,1හි ප්‍රතිශතයක් ලෙස) | ................. |

අපි / මම, ඉහත වාර්තාව නිවැරදි බවටත් සමාගමේ ලේඛන වලට අනුකූල බවටත් මෙයින් සහතික කරමි/ කරමු.

දිනය: .................

..........................................
බලයලත් නිලධාරියාගේ අත්සන

සටහන: පදනම් දිනය පසුගිය මාසයේ අවසන් වැඩ කරන දිනයයි. උදා: අප්‍රියෙල් මාසය සඳහා ද්‍රවශීල වත්කම් ගණනය කරනු ලබන්නේ මාර්තු මාසය අවසානයේ තැන්පතු වගකීම පදනම් කරගෙනය. ද්‍රවශීල වත්කම් පවත්වා ගත යුතු කාලය (පවත්වාගනු ලබන කාලය) පදනම් දිනයෙන් පසුව එන දින දර්ශන මාසයේ පළමු වන වැඩ කරන දිනයෙන් පටන් ගෙන එම මස අවසාන දිනය දක්වා වේ.

12 – 589/8

---

## 2017 අංක 09 රීතිය – ණය පහසුකම් සඳහා වන නියාමන රාමුව

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ 23 වන වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

1. ගනුදෙනුකරුවකුට දිය හැකි උපරිම ණය පහසුකම්

1.1 3 වන විධානයට යටත්ව ආසන්නතම විගණිත මූල්‍ය වාර්තාවන් අනුව එහි මූලික ප්‍රාග්ධනය පදනම් ව 1.2 හි දක්වා ඇති විධානයන්හි පනවා ඇති සීමාවන් ඉක්මවා පහත සඳහන් ගනුදෙනුකරුවන් සඳහා ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් විසින් පහසුකම් සැළසීම සිදු නොකළ යුතුය.

(අ) තනි පුද්ගලයෙකුට, ඔහුගේ සමීප ඥාතීන්ට හෝ ඔහු සමග සැළකිය යුතු ඇල්මක් ඇති සමාගමකට හෝ ආයතනයකට

(ආ) සමස්තයක් වශයෙන් (ප්‍රජා මූලික සංවිධාන හැර) -

(i) කිසියම් තනි සමාගමකට, පොදු සංස්ථාවකට, ආයතනයකට, පුද්ගලයන්ගෙන් සැදුම්ලත් සමාගමකට හෝ ආයතනයකට, හෝ

(ii) සමාගමක් හා පහත ඒවායින් එකක් හෝ කිහිපයක් -

(අ) එහි පාලිත සමාගම්;
(ආ) එහි මව් සමාගම;
(ඇ) එහි ආශ්‍රිත සමාගම;
(ඈ) එහි ඒකාබද්ධ සමාගම්;
(ඉ) එහි මව් සමාගමෙහි පාලිත සමාගමක; හෝ
(ඊ) එම සමාගමේ සැළකිය යුතු ඇල්මක් ඇති සමාගමක් හෝ, එහි පාලිත සමාගමක් හෝ මව් සමාගමක් හෝ මව් සමාගමෙහි පාලිත සමාගමක් හෝ

(ඇ) ප්‍රජා මූලික සංවිධානයකට

1.2

| මට්ටම | මූලික ප්‍රාග්ධනය රුපියල් මිලියන | 1.1(අ) විධානයේ සඳහන් පරිදි ගනුදෙනුකරුවෙකුට අදාළ වන උපරිම ණය පහසුකම් | 1.1(ආ), (ඇ) විධානයේ සඳහන් පරිදි ගනුදෙනුකරුවෙකුට අදාළ වන උපරිම ණය පහසුකම් |
|---|---|---|---|
| I | 2 ට වඩා වැඩි 5 ට අඩු | 200,000 | 300,000 |
| II | 5 ට වඩා වැඩි 10 ට අඩු | 300,000 | 400,000 |
| III | 10 ට වඩා වැඩි 50 ට අඩු | 400,000 | 600,000 |
| IV | 50 ට වඩා වැඩි | 500,000 | 750,000 |

2. සමස්ථ සීමාව

2.1 සියළුම ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන සඳහා:

දෙන ලද ඕනෑම දිනයක දී ඉහත 1 විධානයේ සඳහන් කවර ආකාරයේ ගනුදෙනුකරුවෙකුට හෝ එම වගුවේ දක්වා ඇති උපරිම ප්‍රමාණයට ආසන්නව ලබාදී ඇති ණය පහසුකම්හි මුළු

පිටහිටි අගය, වහාම එළඹෙන මාසයේ අග වන විට ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානය විසින් ශ්‍රී ලංකා රජයට හැර එහි අනෙකුත් සියළුම ගනුදෙනුකරුවන්ට සපයා ඇති මුළු පිටහිටි පහසුකම් ප්‍රමාණයෙන් 40% නොඉක්මවිය යුතුය.

3. පරිභෝජන ණය

ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක පරිභෝජන ණය ශේෂය සම්පූර්ණ ණය කළඹෙන් 30% නොඉක්මවිය යුතුය. (නිවාස ණය හැර), සෑම ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක්ම ආදායම් උත්පාදන ක්ෂුද්‍ර මූල්‍ය ණය සඳහා දිරි ගැන්විය යුතු අතර, ණය ගැණුම්කරුවන්ගේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් සඳහා තාක්ෂණික සහය සහ ධාරිතා වර්ධන පුහුණුව ලබා දිය යුතුය.

4. උපරිම සීමාවන්ගෙන් නිදහස් කිරීම්

4.1 රීති අංක 1 යටතේ උපරිම ණය පහසුකම් ප්‍රමාණය ගණනය කිරීමේදී මුදල්, රත්‍රන්, රජයේ සුරැකුම්පත්, මහ බැංකු සුරැකුම්පත්, භාණ්ඩාගාර ඇපකර, මහ බැංකු ඇපකරයන්ට හානිපූරක වශයෙන් සැපයූ ණය පහසුකම් අඩු කළ හැකිය.

5. ණය නිරාවරණ වර්ගීකරණය

5.1 සෑම ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක්ම නැවත නොගෙවීමේ වර්ගීකරණය පදනම්ව ණය අවදානම් ශ්‍රේණිගත පද්ධතියක් හෝ වර්ගීකරණයක් සකසා ගත යුතුය. එනම් ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් විසින් ලබාදී ඇති නියමිත පරිදි ණය නොගෙවන අවදානම අනුබද්ධ ණය පහසුකම් නිසි පරිදි පිළිබිඹු විය යුතුය. ගනුදෙනුකරුවන්ගේ හානිකරණය වූ පහසුකම් වර්ගීකරණය සඳහා වන අවම මාර්ගෝපදේශය ඇමුණුම 1 වගුව 1 හි දැක්වේ.

5.2 ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක්ම රීති 5.1 ට අනුව ණය පහසුකම් වර්ගීකරණයට අදාළව වෙන්කිරීමක් ගණනය කළ යුත්තේ, පිටහිටි ශේෂයෙන් උපලබ්ධිකර ලබාගත් සුරැකුම් අගය සහ ණය පහසුකමට පොළිය හර කර ඇත්නම් එම අවස්ථාවේදී අත්හිටවූ පොළිය අඩු කිරීමෙනි.

| අක්‍රමික ණය පහසුකම් වර්ගීකරණය | අවම විශේෂිත වෙන්කිරීමේ අවශ්‍යතාවය |
|---|---|
| විශේෂ සඳහන් | 10% |
| අවප්‍රමාණ | 30% |
| අඩමාණ | 60% |
| බොල් | 100% |

6. නියාමන වාර්තාකරණය

6.1 සෑම ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක්ම ඇමුණුම 1 වගුව 2 සහ 3 හි දැක්වෙන ආකෘති අනුකූලව ත්‍රෛමාසික වාර්තාවක් කාර්තුව අවසානවී දින 15 ක් ඇතුළත රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතුය.

7. විධානවලට අනුකූලවීම

7.1 ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් විධාන අංක 1 උල්ලංඝනය කරන බවට රෙජිස්ට්‍රාර් තීරණය කරයි නම්, සහ තීරණය ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයට දන්වා ඇත්නම්, එම උල්ලංඝණය නිවැරදි කිරීම සහ එම නිවැරදි කිරීම රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ රෙජිස්ට්‍රාර් විසින් තහවුරු කරන තෙක් එම ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයට සීමිත ඉතුරුම් තැන්පතු භාරගැනීම සිදු කළ නොහැක.

8. අර්ථ නිරූපනය

8.1 ප්‍රජා මූලික සංවිධානයක් ලියාපදිංචි නීතිමය ඒකකයක් විය යුතු අතර පනතක් මගින් ව්‍යවස්ථාවලියේ/සංස්ථා පත්‍රයේ හෝ නීතියෙන් ණය ලබාගැනීමට හැකි විය යුතුය. ප්‍රජා මූලික සංවිධානයක් වශයෙන් සැළකීමට නම් පහත සඳහන් කොන්දේසි සපුරාලිය යුතු වේ.

(i) ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයත්, ප්‍රජා මූලික සංවිධානයත්, ප්‍රජා මූලික සංවිධානය ක්‍රියාත්මක වන ආයතනයක් සමග ණය ආපසු ගෙවීම සම්බන්ධයෙන් ත්‍රෛපාර්ශ්වික අවබෝධතා ගිවිසුමක් තිබිය යුතුය.

(ii) ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයෙන් ණය ලබාගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩල යෝජනාවක් ප්‍රජා මූලික සංවිධානය සතුව පැවතිය යුතුය.

(iii) ප්‍රජා මූලික සංවිධානයට ණය ලබාදීමේදී බැංකු ප්‍රකාශන සහ විගණිත මූල්‍ය වාර්තා සහ යහපාලනය යන ඒවා සළකා බැලේ.

(iv) පුද්ගලයින්ගේ ණය නැවත ගෙවීමේ හැකියාව ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානය සහ ප්‍රජා මූලික සංවිධානය මගින් වෙන වෙනම තක්සේරු කෙරේ.

8.2 තනි පුද්ගලයෙකුට සම්බන්ධ සමීප ඥාතිත්වය යනුවෙන් අදහස් වන්නේ එම පුද්ගලයාගේ කලත්‍රයා හෝ යැපෙන දරුවන් වේ. යැපෙන දරුවෙකු යන්නට 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ සඳහන් වන අර්ථ නිරූපනය ගෙනදේ.

8.3 සැළකිය යුතු බැඳීමක් යනුවෙන් වෙනත් සමාගමකින් හෝ තනි පුද්ගල වශයෙන් හෝ ඔහුගේ සමීප ඥාතීන් තනිව හෝ එකතුව ගත්විට ඇති ප්‍රතිලාභ සඳහා ඇති අයිතිය සිය ආයතනයේ ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් සියයට දහය (10%) ඉක්මවීම, ආයතනයක් වශයෙන් ගත්විට ප්‍රතිලාභ සඳහා ඇති අයිතිය අදාළ වන්නේ එම ආයතනයේ තනි පුද්ගලයෙක් හෝ ඔහුගේ සමීප ඥාතීන්ට වේ.

8.4 ''මව්'', ''පාලිත'', ''ආශ්‍රිත'' සහ ''ඒකාබද්ධ'', යන්න ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතිවලට අනුව වේ.

8.5 ණය පහසුකම් යනු, පහත සඳහන් වන පරිදි ණය නිරාවරණයන් සහ ආයෝජන නිරාවරණයන් අදහස් වේ.

(අ) ණය නිරාවරණයන් යන්නට ශේෂ පත්‍රය මත ණය පහසුකම් සහ ශේෂ පත්‍රයෙන් පිටත ණය පහසුකම් ඇතුළත් වේ.

(i) ශේෂ පත්‍රය මත පිහිටි ණය නිරාවරණ යනුවෙන් අදහස් වන්නේ, කාලීන ණය, බන්ධිත ණය, ආවර්ත ණය, කුලී පිට ගැනුම්, කල්බදු පහසුකම්, උකස් ණය අත්තිකාරම් සහ ණය සුරැකුම්වලට එදිරිවන ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් සහ ඒ හා අදාළ වන අනෙකුත් අයිතම.

(ii) ශේෂ පත්‍රයෙන් පිටත ණය නිරාවරණ යනුවෙන් අදහස් වන්නේ, ඇපකර සහ බැඳුම්කර ඇතුළත් අවිනිශ්චිත වගකීමක් භාරගැනීමට එකඟත්වයක් ඇතුළත් වෙනත් ඕනෑම පහසුකමක් වේ.

(ආ) රාජ්‍ය සුරැකුම් හි ආයෝජන හැර සියළුම මූල්‍යමය ආයෝජන, ආයෝජන නිරාවරණ වේ.

8.6 *ණය පහසුකම් ප්‍රමාණය* යනු, පහත සඳහන් පරිදි ශේෂ පත්‍රය මත ණය පහසුකම් සහ ශේෂ පත්‍රයෙන් පිටත ණය පහසුකම්වල එකතුව වේ:

(අ) ශේෂ පත්‍රය මත ණය පහසුකම් ප්‍රමාණය: දෙන ලද ඕනෑම අවස්ථාවක පවත්නා ණය පහසුකම් සීමාවේ එකතුව හෝ සියලුම ණය පහසුකම්වල පිටහිටි ප්‍රමාණයේ එකතුව යන දෙකෙන් ඉහළ අගය ශේෂ පත්‍රය මත ණය පහසුකම් යනුවෙන් අදහස් වේ. මුළුමනින්ම ලබාගන්නා කාලීන ණය සම්බන්ධයෙන් වන විට ණය පහසුකම් ප්‍රමාණය ලෙස පිටහිටි ණය පහසුකම් ප්‍රමාණය සැළකිල්ලට ගත යුතුය.

(ආ) ශේෂ පත්‍රයෙන් පිටත ණය පහසුකම් ප්‍රමාණය: දෙන ලද ඕනෑම අවස්ථාවක පවත්නා ණය පහසුකම් සීමාවන්ගේ එකතුව හෝ ණය පහසුකම්වල පිටහිටි ප්‍රමාණය යන දෙකෙන් ඉහළ අගය ශේෂ පත්‍රයෙන් බැහැර ණය පහසුකම් ප්‍රමාණය යනුවෙන් අදහස් වේ.

8.7 *පිටහිටි ණය පහසුකම් ප්‍රමාණය* යනු, මූල්‍ය ප්‍රකාශනවල ශේෂ පත්‍රය මත සහ ශේෂ පත්‍රයෙන් පිටත ණය පහසුකම්හි ඉදිරියට ගෙන යන වටිනාකමයි.

**ශාක්‍ය නානායක්කාර**
අධ්‍යක්ෂ ජනරාල් / රෙජිස්ට්‍රාර්
රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය.

වගුව 1

අවදනම් වර්ගීකරණය සඳහා වන නිර්ණායක - හානිකරණය වූ ණය නිරාවරණයන් වර්ගීකරණය

| වර්ගීකරණය / ණය නිරාවරණ වර්ගය | විශේෂයෙන් සඳහන් කරන ලද | අවප්‍රමාණ | අඩමාන | බොල් |
|---|---|---|---|---|
| දෛනික/සතිපතා/දෙසතියකට වරක් යන පදනම මත ගෙවනු ලබන ණය නිරාවරණ වේ. එනම්, මසකට වඩා අඩු ඕනෑම ණය ආපසු ගෙවීමකි. | ගෙවිය යුතු මුදල, ගෙවිය යුතු දිනයේ සිට දින 30 හෝ ඊට වඩා වැඩි කාලයක් නොගෙවූ නමුත්, දින 60 ට අඩු | ගෙවිය යුතු මුදල, ගෙවිය යුතු දිනයේ සිට දින 60 හෝ ඊට වඩා වැඩි කාලයක් නොගෙවූ නමුත්, දින 90 ට අඩු | ගෙවිය යුතු මුදල, ගෙවිය යුතු දිනයේ සිට දින 90 හෝ ඊට වඩා වැඩි කාලයක් නොගෙවූ නමුත්, දින 120 ට අඩු | ගෙවිය යුතු මුදල, ගෙවිය යුතු දිනයේ සිට දින 120 හෝ ඊට වඩා වැඩි |
| මාසික වශයෙන් ගෙවා නිම කළ ණය නිරාවරණ එනම්, පොළිය හෝ ප්‍රාග්ධනය මාසික වාරික ලෙස ගෙවනු ලබන | ගෙවිය යුතු හා නොගෙවූ මුල් මුදල සහ/ හෝ පොළිය වාරික 3 ක් හෝ ඊට වැඩි නමුත්, වාරික 6 ට අඩු | ගෙවිය යුතු හා නොගෙවූ මුල් මුදල සහ/ හෝ පොළිය වාරික 6 ක් හෝ ඊට වැඩි නමුත්, වාරික 12 ට අඩු | ගෙවිය යුතු හා නොගෙවූ මුල් මුදල සහ/ හෝ පොළිය වාරික 12 ක් හෝ ඊට වැඩි නමුත්, වාරික 18 ට අඩු | ගෙවිය යුතු හා නොගෙවූ මුල් මුදල සහ/ හෝ පොළිය වාරික 18 හෝ ඊට වැඩි |
| කාර්තුමය හෝ අර්ධ වාර්ෂික හෝ වාර්ෂික වාරික වශයෙන් ගෙවනු ලබන ණය නිරාවරණ | ගෙවිය යුතු දින සිට ගෙවීම් පැහැර හැරි දින ගණන 30 ට වැඩි 60 ට අඩු | ගෙවිය යුතු දින සිට ගෙවීම් පැහැර හැරි දින ගණන 60 හෝ ඊට වැඩි නමුත්, දින 120 ට අඩු | ගෙවිය යුතු දින සිට ගෙවීම් නොකළ දින ගණන 120 හෝ ඊට වැඩි නමුත්, දින 180 ට අඩු | ගෙවීම් පැහැර හැරි දින ගණන දින 180 ක් හෝ ඊට වැඩි |
| නිශ්චිත කාලසීමාවක් අවසානයේදී හෝ නියමිත දිනකදී එක් වාරිකයකින් ගෙවනු ලබන ණය නිරාවරණ | ගෙවිය යුතු දින සිට ගෙවීම් පැහැර හැරි දින ගණන 30 ට වැඩි 60 ට අඩු | ගෙවිය යුතු දින සිට ගෙවීම් පැහැර හැරි දින ගණන 60 හෝ ඊට වැඩි නමුත්, දින 120 ට අඩු | ගෙවිය යුතු දින සිට ගෙවීම් නොකළ දින ගණන 120 හෝ ඊට වැඩි නමුත්, දින 180 ට අඩු | ගෙවීම් පැහැර හැරි දින ගණන දින 180 ක් හෝ ඊට වැඩි |

වගුව 2

(…………………… දිනට වැඩිම වටිනාකමකින් යුතු ණය පහසුකම් ලත් 20 දෙනා)

(රුපියල් වලින්)

| පාරිභෝගිකයා/ සමූහයගේ නම | ණය අංකය | පහසුකම් වර්ගය | ණය සීමාව | පිටහිටි ප්‍රමාණය | සුරැකුම් වර්ගය | සටහන් |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

වගුව 3

.................................................... දිනට වෙනත් තොරතුරු[1]

(රුපියල් වලින්)

| අංකය | විස්තරය | ශේෂ පත්‍රය මත | ශේෂ පත්‍රයෙන් පිටත | මුළු එකතුව |
|---|---|---|---|---|
| (අ) | ණය ලබාගත් පාරිභෝගිකයන්ගේ මුළු ගණන | | | |
| (ආ) | ණය පහසුකම් වල මුළු පිටහිටි වටිනාකම | | | |
| (ඇ) | රුපියල් ලක්ෂ තුන (රු. 300,000) ඉක්මවන මුළු පාරිභෝගිකයන් / කණ්ඩායම් ගණන | | | |
| (ඈ) | රුපියල් ලක්ෂ තුන (රු. 300,000) ඉක්මවන මුළු පාරිභෝගිකයන් / කණ්ඩායම්වල ඉදිරියට ගෙන යන වටිනාකම | | | |
| (ඉ) | (ඈ), (අ) හි ප්‍රතිශතයක් ලෙස | | | |

[1] හිඟව තිබෙන ප්‍රමාණය පදනම් කර ගනිමින්

**2017 අංක 10 රීතිය – තොරතුරු සැපයීමේ අවශ්‍යතාවය**

2016 අංක 6 දරන ක්ෂුද්‍ර මූල්‍ය පනතේ 23 වන වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

1. තොරතුරු ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය

1.1 සපයා ඇති ආකෘති අනුව සෑම ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක්ම රෙජිස්ට්‍රාර්, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාල වෙත තොරතුරු යොමු කළ යුතුය.

1 වන උපලේඛනය : වාර්තා කිරීමේ අවශ්‍යතාවය සඳහා කාල රාමුව

| | වාර්තාව | නියමිත කාලය | නියමිත දිනය |
|---|---|---|---|
| i | මූල්‍ය තත්ව ප්‍රකාශනය | කාර්තුමය | ඊළඟ මාසයේ 15 වන දින වන විට |
| ii | විස්තීර්ණ ආදයම් ප්‍රකාශය | කාර්තුමය | ඊළඟ මාසයේ 15 වන දින වන විට |
| iii | මූල්‍ය තත්ව ප්‍රකාශනය | වාර්ෂික | ක්ෂුද්‍ර මූල්‍ය පනතින් නියම කර ඇති පරිදි |
| iv | විස්තීර්ණ ආදයම් ප්‍රකාශය | වාර්ෂික | ක්ෂුද්‍ර මූල්‍ය පනතින් නියම කර ඇති පරිදි |

**ශාක්‍ය නානායක්කාර**
අධ්‍යක්ෂ ජනරාල් / රෙජිස්ට්‍රාර්
රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය.

12 – 589/10

---

**2017 අංක 11 රීතිය – සමාජ වගකීම**

2016 අංක 6 දරන ක්ෂුද්‍ර මූල්‍ය පනතේ 23 වන වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

1. සමාජ වගකීම

සියලුම ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන සෑම වසරකම බදු ගෙවා නිම කිරීමෙන් පසු ශුද්ධ ලාභයෙන් 5% ක ප්‍රමාණයක් සමාජ වගකීම් අරමුදලකට වෙන් කළ යුතුය. එම සමාජ වගකීම් අරමුදලේ මුදල් ජීවනෝපාය සංවර්ධනය, මධ්‍යසාර හා මත්ද්‍රව්‍ය පිටුදැකීම හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ළමා සංවර්ධනය වැනි ව්‍යාපෘති සඳහා යෙදවිය යුතුය.

**ශාක්‍ය නානායක්කාර**
අධ්‍යක්ෂ ජනරාල් / රෙජිස්ට්‍රාර්
රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය.

12 – 589/11

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.